# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2192/4 - 2020 සැප්තැම්බර් මස 07 වැනි සඳුදා - 2020.09.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තේරීපත්වීම හේතුකොට ගෙන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ අංක 06 - බණ්ඩාරනායකපුර කොට්ඨාසයට තේරී පත්වූ ඕවිටිගල විතානගේ මධුර විතානගේ අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ අංක 06 - බණ්ඩාරනායකපුර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මධුකා වීරසිංහ ගුණසේකර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි, පතිරාජ ආරච්චිලාගේ සුනිල් සේනාරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් මධුකා වීරසිංහ ගුණසේකර, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ අංක 06 - බණ්ඩාරනායකපුර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**පී. ඒ. එස්. සේනාරත්න,**
තේරීම්භාර නිලධාරි,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2020 සැප්තැම්බර් මස 07 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ නාගරිකය.

09 - 486


1A - G 32812 — 30 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*